සැ. යු. — (i) 2015.04.17 දින පළ වූ අංක 1911 දරන *ගැසට් පත්‍රයේ* I : III සහ IV(අ) කොටස් පළ නොවීය.
(ii) මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටස යටතේ 2014.12.31 දිනට නියමිත විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර්වරුන්ගේ නාමාවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් පළ වේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,912 - 2015 අප්‍රේල් මස 24 වැනි සිකුරාදා - 2015.04.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 724 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 726 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | 736 |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපළ් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


*සැ. යු.* - ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත් කෙටුම්පත සහ මුදල් පනත් කෙටුම්පත 2015 මාර්තු මස 27 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයන් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට මෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 මැයි මස 15 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 අප්‍රේල් මස 30 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
*රජයේ මුද්‍රණාලයාධිපති (වැ. බ.)*

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


723- B 80942— 5,302 (2015/04)
F 1 -

# පළාත් සභා නිවේදන

**රජයේ ඉඩම් ආඥාපනත යටතේ වාණිජ හා නේවාසික කටයුතු සඳහා ඉඩම් ලබා දීමට වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අන්සතු කිරීමට ඇති ඉඩම් සඳහා අවසර පත්‍ර ලැබීමට ගොවිජන පංතියට අයත් තැනැත්තන් නොවන තැනැත්තන් තෝරා ගැනීම සඳහා වූ ඉඩම් කච්චේරි පිළිබඳ නිවේදනය**

පහත විස්තර කර ඇති ඉඩම් සඳහා ඉල්ලුම්පත්‍ර සලකා බැලීමට සහ ඒවායේ ඉඩම් කොටස් සඳහා අවසරපත්‍ර ලැබීමට සුදුසු තැනැත්තන් තෝරා ගැනීමට වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම්වරයා විසින් 2015 අගෝස්තු මස 03 වැනි දින පෙ. ව. 9.00ට වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී රජයේ ඉඩම් ආඥාපනත යටතේ ඉඩම් කච්චේරියක් පවත්වනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

(අ) දිස්ත්‍රික්කය : පුත්තලම
(ආ) උප දිසාපති හෝ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසය : වනාතවිල්ලුව
(ඇ) ග්‍රාම නිලධාරි කොට්ඨාසය : වනාතවිල්ලුව දකුණ අංක 636/1
(ඈ) ඉඩම පිහිටි ගම : වනාතවිල්ලුව
(ඉ) ඉඩමේ නම : -
(ඊ) ඉඩමේ පිහිටීම : වනාතවිල්ලුව ප්‍රාදේශීය සභා සීමාව තුළ
(උ) අන්සතු කිරීමට ඇති ඉඩම් වල ස්වභාවය : නේවාසික හා වාණිජ කටයුතු සඳහා
(ඌ) අන්සතු කරනු ලබන ඒකකය : පර්චස් 15 සිට අක්කර 01

2. 2008/4 චක්‍රලේඛය අනුව රජයේ ඉඩම් ආඥාපනත යටතේ ඉඩම් ලබා ගැනීම සඳහා ලියාපදිංචි වී ඇති පුද්ගලයින්ගෙන් ලැබෙන ඉල්ලුම්පත්‍ර සලකා බලනු ලැබේ.

ඉහත ආදායම් කාණ්ඩයට අයත් වන බව සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නියම කරනු ලැබිය හැකි සාධක ඉල්ලුම්කරුවන් විසින් ඉදිරිපත් කළ යුතු ය.

3. සියලුම ඉල්ලුම්පත්‍ර 2015.07.24 වැනි දින හෝ ඊට පෙර "ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, වනාතවිල්ලුව" වෙත ලැබිය යුතු ය. සියලුම ඉල්ලුම්පත්‍ර නියමිත ආකෘතියේ විය යුතු ය.

4. ඉල්ලුම්කරු ඉඩම් ලැබීම සඳහා සලකා බලනු ලැබීමට සුදුසු වන්නේ නම් 2015 අගෝස්තු මස 03 වැනි දින පෙ. ව. 9.00 ට වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී පැවැත්වෙන ඉඩම් කච්චේරියට පැමිණෙන ලෙස ප්‍රාදේශීය ලේකම්වරයා ඔහුට නියම කරනු ලැබේ. ඉඩම් ලැබීම සඳහා සලකා බලනු ලැබීමට කැමති සෑම තැනැත්තෙක්ම පෞද්ගලිකව පැමිණිය යුතු ය. එසේ නැතහොත් තමන් නියෝජනය කිරීම සඳහා වෙනත් අයකු ලියවිල්ලක් මගින් ඉදිරිපත් කළ යුතු ය.

5. ඉල්ලුම්කරු හෝ ඔහු නියෝජනය කරන තැනැත්තා විසින් ඉල්ලුම්පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සනාථ කෙරෙන සියලුම සාධක හෝ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නියම කරනු ලබන වෙනත් අදාළ තොරතුරු ඉඩම් කච්චේරියේ දී ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

6. අවසරපත්‍රයක් ලැබීමට තෝරාගනු ලබන සෑම තැනැත්තෙක්ම එසේ තෝරාගනු ලැබූ බව දන්වනු ලැබූ වහාම තෝරාගනු ලැබ ඇත්තේ කවර ඉඩමක් සඳහා වුව ද, එම ඉඩම වෙනුවෙන් නියම කරනු ලැබූ මුදලක් තැන්පත් කළ යුතු වේ. මෙම තැන්පතුව ආපසු නොගෙවනු ලබන නමුත්, තේරුණු තැනැත්තා විසින් ගෙවිය යුතු ගැණුම් මිලට හිලව් කරනු ලැබේ.

7. ඉහත සඳහන් ඉඩම් කච්චේරිය පිළිබඳ විස්තර පහත නම් සඳහන් නිලධාරින්ගෙන් ඔවුන් ඉදිරියෙන් දක්වා ඇති ස්ථානවලදී ලබාගත හැක.

(i) පළාත් ඉඩම් කොමසාරිස් (වයඹ) - පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලය, කුරුණෑගල
(ii) ප්‍රාදේශීය ලේකම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, වනාතවිල්ලුව

ජේ. එම්. ආර්. ජයසිංහ,
පළාත් ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් (වයඹ).

2015 මාර්තු මස 31 වැනි දින.

**රජයේ ඉඩම් ආඥාපනත යටතේ නේවාසික හා කෘෂිකාර්මික කටයුතු සඳහා ඉඩම් ලබා දීමට වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක .................... යන වසම්වල පදිංචිකරුවන් අතරින් තෝරාගනු ලැබීම සඳහා ඉල්ලුම්පත්‍රය**

1. සම්පූර්ණ නම :—————.
2. ජාතික හැඳුනුම්පත් අංකය :—————.
3. (i) ලිපිනය :—————.
   (ii) ඡන්ද බලය ලබා ඇති මැතිවරණ කොට්ඨාසය :—————.
   (අ) ග්‍රාම නිලධාරි කොට්ඨාසය :—————.
4. ගෘහ මූලික අංකය :—————.
5. ස්ත්‍රී/පුරුෂ භාවය :—————.
6. වයස (අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට) :—————.
7. උපන් දිනය :—————.
8. විවාහක/අවිවාහක ද යන වග :—————.
9. රැකියාව :—————.
10. රැකියාව කරන ස්ථානය :—————.
11. අයදුම්කරු කලත්‍රයා (පුරුෂයා හෝ භාර්යාව) ඇතුළු මුළු වාර්ෂික ආදායම :

| නම | අයදුම්කරුට ඇති සම්බන්ධය | රැකියාව | වාර්ෂික ආදායම (රුපියල්) |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

12. ඉල්ලුම්කරු සහ යැපෙන්නන් සතු ඉඩම්වල විස්තර :

| ඉඩමේ නම | ප්‍රමාණය | අයිතියේ ස්වභාවය | පවුලේ පළවෙනි ඉඩමක් නම් පවුලේ අයට හිමි කොටස් |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

(නිවාස සහ දේපළ උපරිම පනත යටතේ දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතු ය.)

13. කලත්‍රයා (පුරුෂයා හෝ භාර්යාව) රජයේ සේවකයකු හෝ සන්නද්ධ හමුදාවක සේවය කරන්නේ නම් ඔහුගේ/ඇයගේ රාජකාරි ලිපිනය :————.

14. දැනට තමා පදිංචි නිවසේ තත්ත්වය :————
(තමාගේ ද?/බද්දට ද?/කුලියට ද?/අනවසරයෙන් ද? යන වග)

15. නිවස පිහිටි ස්ථානය :————.

16. යැපෙන දරුවන් පිළිබඳ විස්තර :————.

17. ඉගෙනුම ලබන දරුවන් පිළිබඳ විස්තර :

| නම | වයස | ඉගෙනුම ලබන්නේ නම් පාසලේ / විද්‍යාලේ නම | ඉගෙනුම ලබන පංතිය/ශ්‍රේණිය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

18. ඔබ හෝ කලත්‍රයා විසින් ඉඩමක් හෝ නිවසක් මිල දී ගැනීම සඳහා රජයෙන් හෝ සේවය කරන ආයතනයෙන් ණය මුදලක් ලබාගෙන ඇත් ද? ලබාගෙන ඇත්නම් පහත සඳහන් විස්තර සපයන්න :

(i) ලබාගත් ණය මුදල :————.
(ii) ණය ලබාගත් ආයතනයේ/දෙපාර්තමේන්තුවේ නම :————.
(iii) දැනට ගෙවීමට ඇති ශේෂය :————.

19. පවුලේ යම් සාමාජිකයෙක් මුදල් ඉතිරි කර තිබේ ද? තිබේ නම් විස්තර සපයන්න :

| පවුලේ සාමාජිකයාගේ නම | ඉතිරි කිරීමේ ගිණුම පවත්වාගෙන යන ආයතනය | ඉතිරි කළ මුදල |
|---|---|---|
| | | |
| | | |
| | | |

20. ඉඩම්ලාභියෙකු වශයෙන් යථා කාලයේ දී තෝරාගනු ලැබුවහොත් ඉඩමේ වටිනාකම රජය තීරණය කරනු ලබන අන්දමට ගෙවීමට එකඟ වන අතර, ඉඩම බදු ගැනීමෙන් අනතුරුව මාස 06 ක කාල සීමාවක් තුළ ඉඩමේ නිවසක් ඉදිකිරීම සඳහා කටයුතු කිරීමට එකඟ වෙමි. මා විසින් ඉදිරිපත් කරන තොරතුරු, තෝරා ගැනීමෙන් පසුව වුව ද අසත්‍ය බව හෙළි වුවහොත් මගේ තෝරා ගැනීම ඕනෑම අවස්ථාවක අවලංගු කළ හැකි බවත් දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

ඉහත අයදුම්කරු විසින් ඡේද අංක 1 සිට 19 දක්වා ප්‍රකාශ කර ඇති තොරතුරු මා පරීක්ෂා කළ බව ද, එම තොරතුරු මා දන්නා තරමින් නිවැරදි බව ද මෙයින් සහතික කරමි.

————,
ග්‍රාම නිලධාරිගේ අත්සන.

නම :————.
ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————.

අනු අත්සන් කරමි.

————,
ප්‍රාදේශීය ලේකම්ගේ අත්සන.

නම :————.
ලිපිනය :————.

**දිවුරුම් ප්‍රකාශය**

............................... දිස්ත්‍රික්කයේ ........................ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ......................... ග්‍රාම නිලධාරි වසමේ පදිංචි.................................. වන මම, පහත සඳහන් පරිදි ප්‍රකාශ කරමි.

(1) මට ද, මාගේ කලත්‍රයාට ද සහ වයස අවුරුදු 18 ට අඩු මාගේ දරුවන්ට ද, සාමුහිකව ශ්‍රී ලංකාව තුළ (රජයේ ඉඩම සහ පුද්ගලික ඉඩම ද ඇතුළුව) අක්කර 50 කට (පනහකට) අඩුවෙන් තිබෙන බවට සහ 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 18 වැනි වගන්තිය යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමට හෝ 1973 අංක 01 දරන නිවාස දේපළ උපරිම පනත යටතේ හෝ ප්‍රකාශයක් කර නැති බව ද සහතික කරමි.

(2) එසේ ඉහත කී අක්කර .................. රූඩ්. ...................... පර්. .................... ක් වූ ඉඩම පවරා ගැනීමෙන්, මිල දී ගැනීමෙන් පසුව වුව ද, ඉහත ඡේදයේ සඳහන් කර ඇති අක්කර පනහේ (50) සීමාව නොඉක්මවන බවත්, වැඩිදුරටත් මෙයින් සහතික කරමි.

.................................................,
දිවුරුම්කරුගේ අත්සන.

ඉහත සඳහන් දිවුරුම්කරු/කාරිය මෙහි අඩංගු දෑ කියවා තේරුම්කර දුන් අතර ඔහු/ඇය මෙහි සඳහන් කරුණු හොඳින් තේරුම් ගැනීමෙන් පසුව මා ඉදිරියේ අත්සන් තැබූ බවත් සහතික කරමි.

————,
සාමදාන විනිශ්චයකාර තැන.

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව බස්නාහිර පළාත් සභාව**

හෝමාගම සහ වල්පිට දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානයන්හි පැවැත්වෙන එක් අවුරුදු වෘත්තීය කෘෂිකර්ම පුහුණු පාඨමාලාව හා සමගාමීව "ක්ෂේත්‍ර සහායක (කෘෂිකර්ම)" ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ 4) පුහුණු පාඨමාලාව - 2015/2016

ඉහත පාඨමාලාව සඳහා ශිෂ්‍ය ශිෂ්‍යාවන් බඳවා ගැනීම පිණිස අයදුම්පත් බස්නාහිර පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් කැඳවනු ලැබේ. පාඨමාලාව පවත්වනු ලබන්නේ සිංහල මාධ්‍යයෙනි. මෙම පාඨමාලාව කෘෂිකාර්මික අංශයේ රැකියා අවස්ථා සඳහා මෙන්ම ස්වයං රැකියා පදනමක් මත ක්‍රියාත්මක වීමට ඉදිරිපත් වන්නන් සඳහා ඉලක්කකර ඇත.

02. ප්‍රායෝගික හා න්‍යායාත්මක පුහුණුවක් ලෙස පවත්වනු ලබන මෙම පාඨමාලාව සාර්ථකව නිමකරන ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙත බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහතික පත්‍ර ප්‍රදානය කරනු ලැබේ. තව ද තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිසම වෙතින් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ 4) සහතික ලබා ගැනීමට ද අවස්ථාව සලසා දෙනු ලබයි. පාඨමාලාවේ අන්තර්ගත විෂයයන් පහත පරිදි වේ.

NVQ 4 ට අදාළව,

1. M - 01 - බිම් සැකසීම හා පාංශු සංරක්ෂණය අධීක්ෂණය
2. M - 02 - පැළ තවාන සංස්ථාපනය හා නඩත්තුව අධීක්ෂණය
3. M - 03 - ක්ෂේත්‍රයේ බෝග සංස්ථාපනය හා නඩත්තුව අධීක්ෂණය
4. M - 04 - ඵල නෙලීම හා අස්වනු සැකසීම - අධීක්ෂණය
5. M - 05 - යන්ත්‍රෝපකරණ භාවිතය හා නඩත්තුව අධීක්ෂණය
6. M - 06 - පරිපාලන ක්‍රියාකාරකම්
7. M - 07 - වෘත්තීය ආරක්ෂාව

සහ අතිරේකව සත්ව පාලනය, වී වගාව, ගෘහ ආර්ථික විද්‍යාව, ව්‍යවසායකත්වය.

ඉහත විෂයයන් ඔස්සේ පාඨමාලාව ඉදිරිපත් කිරීමේ දී නව කෘෂිකාර්මික තාක්ෂණ වර්ධනයට අදාළ නවතම සොයා ගැනීම් (උදා.- පසු අස්වනු තාක්ෂණය, හරිතාගාර වගා ක්‍රම), ස්වයං රැකියා උපාය මාර්ග (උදා.- භූමි දර්ශ ස්ථාපනය, ගොවිපල ගිණුම්, ගොවිපළ උපකරණ නඩත්තුව හා ට්‍රැක්ටර් යන්ත්‍ර පැදවීමට හුරු කිරීම) සහ තොරතුරු සැකසීමේ නව ක්‍රම සඳහා හුරුවක් ලබා දීම ද (උදා.- පරිගණක භාවිතය) සිදුකරනු ඇත. එසේම ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ඉංග්‍රීසි දැනුම වර්ධනය සහ කාලීනව බල පවත්වන කෘෂිකාර්මික ප්‍රතිපත්ති පිළිබඳ අවබෝධයක් ද ලබා දෙනු ඇත.

03. *පාඨමාලාව පවත්වාගෙන යෑම.-* වසරක කාලයකින් සමන්විත පාඨමාලාවේ අධ්‍යයන වාර තුනක් වේ. දෙවන වාර අවසානයේ දී එනම් මොඩියුල හදාරා නිම වූ පසු ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්වේ. තව ද මෙම මොඩියුල කාල සීමාව තුළ අඛණ්ඩ ඇගයීම ද දිගටම සිදු කෙරේ. පළමු හා දෙවන වාර තුළ දී අධ්‍යයන චාරිකා ද සැලසුම් කර ඇත. තුන්වන වාරය තුළ දී සෑම ශිෂ්‍ය ශිෂ්‍යාවකටම තමන් තෝරා ගත් විෂය ක්ෂේත්‍රයන් මත බාහිර කෘෂිකර්ම ව්‍යාපාරයක්/ආයතනයක් සමග සම්බන්ධ වී ව්‍යාපෘති අධ්‍යයනයක් සිදු කළ යුතු යි. එම කාර්යය නිමාවත් සමග අවසාන ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ පවත්වනු ඇත. පාඨමාලාවට පැමිණීම 85%ක් සම්පූර්ණ කරමින් අඛණ්ඩ ඇගයීමක් තුලින් සමත් වන ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙත පාඨමාලාව අවසානයේ සහතික පිරිනමනු ලැබේ. එසේම මෙම ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිසම වෙතින් ක්ෂේත්‍ර සහායක (කෘෂිකර්ම) - NVQ 4 තෘතීයික වෘත්තීය සුදුසුකම් සහතික ලබා ගැනීමට ද අවස්ථාව සලසා දෙනු ලැබේ.

04. *බඳවා ගැනීමේ පරිපාටිය.-*

04.1 *අධ්‍යාපනික සුදුසුකම් :*

1. අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී සිංහල භාෂාව (භාෂාව හා සාහිත්‍ය), ගණිතය, විද්‍යාව, සමාජ අධ්‍යයනය හා තාක්ෂණික විෂය, (කෘෂිකර්මය, මැහුම් වැඩ, ගෙවතු වගාව, ගෘහ ආර්ථික විද්‍යාව, වාණිජ්‍යය හා ගිණුම්, මෝටර් කාර්මික ශිල්පය) ඇතුළුව සම්මාන 02ක් සහිතව විෂයයන් හයකින් දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත්වීම.

04.2 *වෙනත් සුදුසුකම්.-*

(i) සියලුම අයදුම්කරුවන් අයදුම්පත් කැඳවන දිනට වයස අවුරුදු 17ත් 25ත් අතර විය යුතු ය.

(ii) අයදුම්කරුවන් අවිවාහක විය යුතු ය.

(iii) ප්‍රායෝගික කෘෂිකර්මයේ නියැලීමට සුදුසු සෞඛ්‍ය තත්වයෙන් පසුවිය යුතු ය.
(මෙය සනාථ කිරීමට රජයේ වෛද්‍ය නිලධාරියකුගෙන් ලබාගත් සහතිකයක් පාඨමාලාව ආරම්භයේ දී ඉදිරිපත් කළ යුතු ය.)

(iv) සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් බස්නාහිර පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයකින් තෝරාගනු ලැබේ.

(v) කෘෂිකර්ම කටයුතුවල නිරත පුද්ගලයෙකු වීම හා එය වෘත්තියක් වශයෙන් ඉදිරියට ගෙන යාමට සූදානම් අයවළුන් වෙත විශේෂ අවධානය යොමු කෙරේ.

(vi) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්නයෙන් වූ වර්ෂ තුනක කාලය තුළ අඩුම වශයෙන් වර්ෂ දෙකක්වත් බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය තිබූ බවට පදිංචි ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගත් පදිංචිය පිළිබඳ සහතිකයකින් සනාථ කළ යුතු ය.

ඊට අතිරේකව,

අධ්‍යාපන හා අනෙකුත් අවශ්‍යතාවයන් සපුරාලන බස්නාහිර පළාතේ පදිංචිකරුවෙකු නොවන අයෙකු පාඨමාලාව හැදෑරීමට කැමැත්තක් දක්වන්නේ නම්, ඔවුන්ට ද ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමට අවස්ථාවක් සලසනු ලැබේ. එසේ වුව ද, අයදුම්කරුවන් තෝරා ගැනීමේ දී ඉහළම ප්‍රමුඛස්ථානය ලබා දෙන්නේ, බස්නාහිර පළාතේ පදිංචිකරුවන් සඳහා වේ. බස්නාහිර පළාතේ පදිංචි අයගෙන් ප්‍රමාණවත් අයදුම්පත් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවන්නේ නම්, පිටපළාත්වල අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගැනීමට තීරණය කර ඇත.

05. *පාඨමාලාව සඳහා දිරි ගැන්වීමේ දීමනා.-*

(i) පුහුණුව ලබන කාලය තුළ, පුහුණුවට පැමිණෙන දිනකට එක් අයෙකු සඳහා රුපියල් දෙසිය පනහක (රු. 250) පුහුණු දිරි ගැන්වීමේ දීමනාවක් ගෙවනු ලබන අතර, එය ආහාර පාන සඳහා වැය කිරීමට සිදුවනු ඇත.

(ii) නේවාසිකාගාර පහසුකම් පුහුණුව ලබන කාලය තුළ දී සෑම සිසුවකුටම නොමිලේ සපයනු ලැබේ.

06. පාඨමාලාවට සහභාගිවීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියා පරිපාටිය

(i) රුපියල් දෙසිය පනහක (රු. 250/-) ක තැන්පතුවක් තැබිය යුතු ය.

(ii) පුහුණුවෙන් පසු කෘෂිකර්මාන්තයේ නියැලීම පිණිස අවශ්‍ය මූලික පහසුකම් සුළු ප්‍රමාණයක් හෝ තිබිය යුතු ය.

(iii) පුහුණුවෙන් පසු රජයේ රැකියාවක් සැපයීමට බස්නාහිර පළාත් සභාව හෝ මධ්‍යම රජය බැඳී නොමැති බව විශේෂයෙන් අවධාරණය කෙරේ.

(iv) පුහුණුව ලබන කාලය තුළදී පුහුණු ආයතන විසින් පවත්වනු ලබන පොදු නීති-රීති වලට එකඟ වන බවට ලිඛිතව ප්‍රකාශ කළ යුතු ය.

(v) පුහුණු කාල සීමාව තුළ විනය විරෝධී හා නීති-රීති වලට පටහැනිව කටයුතු කරන්නන්ගේ ශිෂ්‍යභාවය අහෝසි කිරීමට බලධාරීන් විසින් කටයුතු කරනු ලැබේ.

07. මෙහි පහත සඳහන් ආකෘතිය අනුව පිළියෙල කරගත් අයදුම්පත් අඟල් 8 1/2 x 12 (A4) ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත ප්‍රයෝජනයට ගනිමින් 2015 ජූනි 30 වැනි දිනට හෝ එදිනට පෙර "පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ (බස්නාහිර), පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය, අංක 154, මහාචාර්ය නන්දදාස කෝදාගොඩ මාවත, කොළඹ 07" ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

අයදුම්පත බහාලන කවරයේ වම්පස උඩ කෙලවරේ "2015/2016 වසර සඳහා එක් අවුරුදු වෘත්තීය කෘෂිකර්ම පුහුණු පාඨමාලාව සඳහා අයදුම්පත" යනුවෙන් ලියා එවිය යුතු ය.

(i) බඳවා ගැනීම සම්බන්ධව අවසාන තීරණය බස්නාහිර පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ සතු ය.

(ii) අසම්පූර්ණ හෝ අවිධිමත් ඉල්ලුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන්නේ තෝරාගත් සීමිත අයදුම්කරුවන් සංඛ්‍යාවක් පමණි.

(iii) දැනට පාසල් හැරගොස් ඇති ශිෂ්‍ය/ශිෂ්‍යාවන්ට පමණක් සැලකිල්ලක් දක්වන බැවින් සම්මුඛ පරීක්ෂණයේ දී පාසල් හැරයාමේ සහතිකය අනිවාර්යෙන්ම ඉදිරිපත් කළ යුතු ය.

(iv) තමා අධ්‍යාපනය ලැබූ විදුහලෙන් සහ ප්‍රදේශයේ ප්‍රභුවරයෙකුගෙන් මෑතක දී ලබාගත් චරිත සහතිකවල පිටපත් දෙකක් අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් සඳහා සහතිකවල පිටපත් අයදුම් පත්‍රයට යා කර එවිය යුතු ය.

(v) ජාතික හැඳුනුම්පත සමඟ අධ්‍යාපන හා වෙනත් සහතිකවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී පමණක් ඉදිරිපත් කළ යුතු ය.

අයි. යූ. මෙන්ඩිස්,
පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ,
(බස්නාහිර)

2015 අප්‍රේල්,
පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය (බස්නාහිර)
අංක 154,
මහාචාර්ය නන්දදාස කෝදාගොඩ මාවත,
කොළඹ 07.

**හෝමාගම (පිරිමි) වල්පිට (කාන්තා) දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානවල එක් අවුරුදු වෘත්තීය කෘෂිකර්ම පුහුණු පාඨමාලාව හා සමගාමීව "ක්ෂේත්‍ර සහායක (කෘෂිකර්ම)" ජාතික වෘත්තීය සුදුසුකම් :හඩු 4* පුහුණු පාඨමාලාව 2015/2016 සඳහා ශිෂ්‍ය ශිෂ්‍යාවන් බඳවා ගැනීමේ ආදර්ශ අයදුම්පත්‍රය**

1. අපේක්ෂකයාගේ සම්පූර්ණ නම :..........................................................................................
..........................................................................................

2. මුලකුරු සමග නම :..........................................................................................
..........................................................................................

3. (i) ස්ථිර ලිපිනය :..........................................................................................
..........................................................................................

(ii) පදිංචි දිස්ත්‍රික්කය :..........................................................................................
..........................................................................................

4. අපේක්ෂකයාගේ සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

5. මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

6. (i) ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

(ii) පදිංචි දිස්ත්‍රික්කය :

(iii) ජංගම දුරකථන අංකය :

(iv) නිවසේ දුරකථන අංකය :

7. ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී : පුරුෂ :

8. උපන් දිනය : වර්ෂය : මාසය : දිනය :

(i) හැඳුනුම්පත් අංකය :

(ii) හැඳුනුම්පත නිකුත් කළ ආයතනය හා දිනය :..........................................................................................
..........................................................................................

9. පියාගේ හෝ භාරකරුගේ නම :..........................................................................................
..........................................................................................

10. පියාගේ හෝ භාරකරුගේ ලිපිනය :..........................................................................................
..........................................................................................

11. *අධ්‍යාපන සුදුසුකම්.-*

*(අ)* අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගය (................වර්ෂය)

| *සමත් විෂයයන්* | *ලැබූ සාමාර්ථයන්* | *සමත් විෂයයන්* | *ලැබූ සාමාර්ථයන්* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

*(ආ)* අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගය (................වර්ෂය)

| *සමත් විෂයයන්* | *ලැබූ සාමාර්ථයන්* | *සමත් විෂයයන්* | *ලැබූ සාමාර්ථයන්* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

*(ඇ)* අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උ. පෙළ) විභාගය (............වර්ෂය)

| *සමත් විෂයයන්* | *ලැබූ සාමාර්ථයන්* |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

12. වෙනත් බාහිර සුදුසුකම් හා බාහිර ක්‍රියාකාරකම්.-

(i) ..........................................................................................
(ii) ..........................................................................................
(iii) ..........................................................................................

13. ඔබ උසස් අධ්‍යාපන ආයතනයක හෝ කාර්මික විද්‍යාලයක/ ආයතනයක පාඨමාලාවක් සඳහා තේරී පත්වී සිටී ද? එසේ නම් ඒ පිළිබඳ විස්තර සඳහන් කරන්න.

..........................................................................................
..........................................................................................
..........................................................................................

ඉහත තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. කිසියම් තොරතුරක් අසත්‍ය යැයි මා තෝරා ගැනීමෙන් පසු එළිදරව් වුවහොත් කිසිම පරීක්ෂණයකින් තොරව මාගේ ආධුනිකභාවය අවලංගු වන බව දනිමි.

දිනය :............................ ....................................................

අයදුම්කරුගේ අත්සන.

04-709

**මධ්‍යම පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 වැනි පන්තියේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2015**

1.0 මධ්‍යම පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 වැනි පන්තියේ III වැනි ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සුදුසුකම්ලත් මධ්‍යම පළාතේ ස්ථිර පදිංචිය සහිත අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2.0 මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්, මධ්‍යම පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 වැනි පන්තියේ III වැනි ශ්‍රේණියේ තනතුරු සඳහා පත්කර ගනු ඇත.

3.0 මෙහි දී පිරවීමට නියමිත මුලු පුරප්පාඩු සංඛ්‍යාව 10කි. පත්වීම ක්‍රියාත්මක වන දිනය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් ඇබෑර්තු සංඛ්‍යාවක් හෝ ඇබෑර්තු සියල්ලම හෝ නොපිරවීමට මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

4.0 *වැටුප.*-මධ්‍යම පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3-III, 3-II හා 3-I වන ශ්‍රේණිවලට අදාළ මාසික වැටුප් පරිමාණය - රු. 14,425, 10x145 -11x 170-6x 240-14x 320 රු. 23,665 (MT-1-2006-A) වේ. රු. 16,045න් ඔබ්බට යාම සඳහා II වැනි ශ්‍රේණියට උසස් වීම ද රු. 17,985න් ඔබ්බට යාම සඳහා I වැනි ශ්‍රේණියට උසස් වීම ද ලබා ගත යුතු ය.

5.0 මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත ය.

6.0 *සුදුසුකම්.*- මධ්‍යම පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 වැනි පන්තියේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් අදාළ වේ.

*(අ)* මධ්‍යම පළාත් සභා බල ප්‍රදේශය තුළ අවම වශයෙන් අවුරුදු 03ක ස්ථිර පදිංචිය ඇති ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.

*(ආ)* (i) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනයට වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 35ට නොවැඩි විය යුතු ය.

(ii) මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරුවල සේවයේ නියුතු සුදුසුකම් සපුරන අයදුම්කරුවන් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනයට වයස අවුරුදු 45ට නොඑළඹ සිටිය යුතු ය.

*(ඇ)* යහපත් චරිතයකින් සහ මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය.

*(ඈ)* මධ්‍යම පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතු ය.

*(ඉ)* *අධ්‍යාපන සුදුසුකම්.-*

01. භාෂාව, ගණිතය හා ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථය ඇතුලුව සම්මාන 5ක් සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (06) සමත් වීම, සහ

02. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් විෂයයන් 3ක් සමත් වීම (සාමාන්‍ය ඉංග්‍රීසි, මෙහිදී විෂයයක් ලෙස නොසැලකේ.)

(ඊ) *වෘත්තීය සුදුසුකම්.-* අවම වශයෙන් ජාතික වෘත්තීය කුසලතා (NVQ) සහ (05) මට්ටමේ හෝ ඊට ඉහළ පරිගණක/තොරතුරු තාක්ෂණ පාඨමාලාවක් හදාරා තිබීම.

සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දින හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

7.0 *විභාග පරිපාටිය :*

(i) විභාගය, ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්ත වේ. මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වේ. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(ii) විභාග විෂයයන් සහ ඒ ඒ විෂයයට වෙන් කරන ලද ලකුණු පහත දැක්වේ.

| | | *ලකුණු* | *කාලය* |
|---|---|---|---|
| (i) | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ලිඛිත පරීක්ෂණය | 100 යි | පැය 2යි |
| (ii) | අභියෝග්‍යතාවය | 100 යි | පැය 1යි |
| | මුළු ලකුණු | 200 යි | |

*තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ලිඛිත පරීක්ෂණය.-* විභාග අපේක්ෂකයාගේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ සාමාන්‍ය දැනුම පරීක්ෂා කරනු ලබන ප්‍රශ්න, මෙම ප්‍රශ්න පත්‍රයට ඇතුළත් වේ. එය බහුවරණ ප්‍රශ්න මෙන්ම කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්නවලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය. මෙහෙයුම් පද්ධතීන්, මෘදුකාංග, දෘඪාංග, වදන් සැකසුම්, පැතුරුම්පත්, දත්ත සමුදා කළමනාකරණය, අන්තර්ජාලය සහ ඉලෙක්ට්‍රොනික තැපෑල ආදී ක්ෂේත්‍ර පිළිබඳව විභාග අපේක්ෂකයා සතු දැනුම පරීක්ෂණයට භාජනය කරනු ලැබේ.

*අභියෝග්‍යතාව.-* මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයන්ගේ සංඛ්‍යාත්මක හැකියාව, තර්කානුකූලබව, විශ්ලේෂණාත්මක හැකියාව, සාමාන්‍ය බුද්ධිය ආදිය මැනෙන අයුරින් සැකසෙන බහුවරණ ප්‍රශ්න 50කින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

*සටහන.-*රාජකාරී කටයුතු සඳහා අපේක්ෂකයන්ගේ යෝග්‍යතාව හා හැකියාව පරීක්ෂා කිරීම පිණිස මෙම ප්‍රශ්න පත්‍ර සකස් කෙරේ. මෙම විභාගය තරඟ විභාගයක් වුව ද පත්වීම් ලැබීමට සුදුසුකම් ලැබීම සඳහා එක් එක් විෂය සඳහා වෙන් කර ඇති ලකුණු වලින් යටත් පිරිසෙයින් සියයට හතළිහක්වත් (40%) අපේක්ෂකයින් විසින් ලබාගත යුතු අතර, විභාගයේ මුළු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් සියයට පනහක්වත් (50%) ලබාගත යුතු වේ. තරග විභාගය සඳහා වෙන් කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබාගත් ලකුණු අනුපිළිවෙලට වූ කුසලතා අනුපිළිවෙල තරගයේම අනුගමනය කරමින් පත්වීම් දෙනු ලැබේ.

8.0 *ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්.-* අයදුම්පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතු ය. මෙම විභාගයේ නීති රීති අනුව යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත්, විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්ව අවලංගු කළ හැකි ය. අයදුම්කරුවෙක් විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන.

9.0 *විභාග ගාස්තු.-* විභාග ගාස්තුව රු. 600කි. මෙම මුදල මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක 20-03-02-13 දරන ආදායම් ශීර්ෂයට බැර වන සේ මධ්‍යම පළාතේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා අයදුම්කරුගේ නමින් ම ලබා ගන්නා ලද ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතු ය. (ලදුපතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබාගත යුතු ය.) කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර මුදල් ඇණවුම් හා මුද්දර භාරගනු නොලැබේ.

10.0 *අයදුම්පත්‍.-* A 4 (සෙ. මී. 21 x සෙ. මී. 29) (සාමාන්‍ය හාෆ්ෂීට්) ප්‍රමාණයේ කඩදාසි භාවිතා කරමින්,

*(ආ)* අංක 1 සිට 4 තෙක් ඡේදයන් පළමු පිටුවට ද,
*(ආ)* අංක 5 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලට ද, ඇතුළත් වන සේ අයදුම්පත්‍රය පිළියෙල කරගත යුතු ය.
*(ඇ)* අයදුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම, සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතු ය.

නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතු ය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති අතර, සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැකිය.

(i) *ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ සෑම අතින්ම සම්පූර්ණ* අයදුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන්ට තරග විභාගයට පෙනී සිටීමට මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ලැබේ. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා ගැසට් නිවේදනය අනුව, සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කෙරෙන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

(ii) අයදුම්පත බහා එවන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ "මධ්‍යම පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 වැනි පන්තියේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2015" යන්න ද සඳහන් කරන්න.

(iii) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධරයෙකු, වාර්ෂික වැටුප රු. 240,360ක් හෝ

ඊට වැඩි රජයේ ස්ථිර තනතුරක් දරන නිලධරයෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

(iv) සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2015.05.26 දින හෝ ඊට පෙර "ලේකම්, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 244, කටුගස්තොට පාර, මහනුවර." යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

11.0 *විභාගයට පෙනී සිටීම.-* අයදුම්පත්‍ර ඉදිරිපත් කර ඇති නිලධාරීන් වෙත මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කරනවා ඇත. ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම්, ඒ බව මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දන්වා සිටිය යුතු ය. (ඔබ වෙත තබාගත් පිටපත්, විභාග ගාස්තු ගෙවීමෙන් ලද කුවිතාන්සියේ පිටපත සහ ඉල්ලුම්පත්‍රය, තැපෑලෙන් යොමු කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද අතැතිව විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය සඳහන් කරමින් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතින් විමසා සිටීම ද වඩාත් ඵලදායී වනු ඇත.)

12.0 අපේක්ෂකයින්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලි වලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය :-

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත,

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

13.0 විභාග පැවැත්වීම සම්බන්ධයෙන් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

14.0 මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් පොදු විභාග නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

15.0 මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් වේ නම් සිංහල නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කළ යුතු ය.

ආර්. එම්. එන්. රත්නායක,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත.

2015 මාර්තු මස 27 වැනි දින,
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
අංක 244,
කටුගස්තොට පාර,
මහනුවර.

වෙබ් අඩවිය : www.psc.cp.gov.lk

ආදර්ශ අයදුම්පත්‍රය

***මධ්‍යම පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 වැනි පන්තියේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2015***

*Open Competitive Examination for Recruitment to Class 3 - Grade III of the Central Provincial Information and Communication Technology Service - 2015*

විභාග අංකය : [ ]
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

විභාගය පෙනී සිටින භාෂා මාධ්‍යය :- [ ]
(අදාළ සංකේතය කොටුව තුළ ලියන්න)
(සිංහල - S, දෙමළ - T, ඉංග්‍රීසි - E)

01. 1.1 මුලකුරු සමග නම :..............................................................
මයා/මිය/මෙනවිය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.2 මුලකුරු සමග නම :..............................................................
මයා/මිය/මෙනවිය (සිංහලෙන්/දෙමළෙන්)

1.3 මුලකුරුවලින් හැඳින්වෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :......
..................................................................................................

1.4 මුලකුරුවලින් හැඳින්වෙන නම් (සිංහලෙන්/දෙමළෙන්) :..........
..................................................................................................

02. 2.1 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :....................................

2.2 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :...............
..................................................................................................

2.3 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :............
..................................................................................................

2.4 දැනට රාජ්‍ය සේවයේ නිරත වූවෙකු නම් කාර්යාලයීය ලිපිනය :..................................................................................................

2.5 දුරකථන අංකය :......................................................................

03. 3.1 උපන් දිනය :........................................................................

3.2 අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට වයස :

අවුරුදු :...................... මාස :...................... දින :......................

3.3 ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | ]

04. ස්ත්‍රී/පුරුෂ භාවය :................................................................

05. 5.1 අයදුම්කරු ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :......................................

| ඡන්ද හිමි නාමලේඛනයට අනුව පදිංචිය | 2012 | 2013 | 2014 |
|---|---|---|---|
| මැතිවරණ කොට්ඨාසය | | | |
| ඡන්ද ප්‍රදේශය | | | |
| ඡන්ද කොට්ඨාසය | | | |

| | 2012 | 2013 | 2014 |
|---|---|---|---|
| ග්‍රාම නිලධාරි කොට්ඨාස අංකය | | | |
| ගෘහ අංකය | | | |
| නමට ඉදිරියෙන් ඇති පිළිවෙල අංකය | | | |

06. *අධ්‍යාපන සුදුසුකම්.-*

6.1 අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය :

පළමුවර : දෙවන වර :

වසර :............................ වසර :............................
විභාග අංකය :......................... විභාග අංකය :.........................

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

6.2 අ.පො.ස. (උසස් පෙළ) විභාගය :

වසර :............................ විභාග අංකය :.........................

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |

07. වෘත්තීය සුදුසුකම් :

| *ආයතනය* | *හදාරා ඇති පාඨමාලාව* | *කාල සීමාව* | *සාමාර්ථය* | *සහතිකපත් අංකය හා දිනය* |
|---|---|---|---|---|
| | | | | |

08. වෙනත් සුදුසුකම් :..................................................................................................

09. විභාග ගාස්තු ගෙවීම පිළිබඳ තොරතුරු :

(i) විභාග ගාස්තු ගෙවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නම :————.
(ii) දිනය :————.
(iii) කුවිතාන්සි අංකය :————.

*(මුදල් ගෙවා ලබාගත් ලදුපත මෙම තීරුව අසලින් අලවන්න.)*

*අයදුම්කරුගේ ප්‍රකාශය*

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. මෙහි සඳහන් කරුණු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව අනාවරණය වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සකු වන බවත්, පත්වීමක් ලැබීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් සේවයෙන් පහකිරීමට යටත් වන බවත් මා දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

*අයදුම්කරුගේ අත්සන සහතික කිරීම*

මෙම අයදුම්පත ඉදිරිපත් කරන...........................................................................මහතා/ මහත්මිය/මෙනවිය මම පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය අද දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත්, සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන.

දිනය :————.

සහතික කරන්නාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.

10. රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවාවන්හි දැනට සේවයෙහි නියුතු අයදුම්කරුවෙකු නම් පහත සඳහන් සහතිකය දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සම්පූර්ණ කළ යුතු ය.

මෙම ඉල්ලුම්කරු වන ................................................................................... මහතා/ මහත්මිය/මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ............................ වශයෙන් සේවය කරයි. පසුගිය වසර කීපය තුළ ඔහු/ඇය මොනම ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව සහ ඉහත තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා මුදා හැරිය හැකි බවත් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව සහිතව)

දිනය :————.

04-857

**මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ භාෂා පරිවර්තක තනතුරේ I පන්තියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය**

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ භාෂා පරිවර්තක තනතුරෙහි පවතින පුරප්පාඩු 14 සම්පූර්ණ කිරීමට, භාෂා පරිවර්තක I වැනි පන්තියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සුදුසුකම් සහිත අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1.1 මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන විවෘත තරග විභාගයේ ප්‍රතිඵල ප්‍රමුඛතාව අනුව, සුදුසුකම් පරීක්ෂාකර බැලීමේ සම්මුඛ පරීක්ෂණයකට ලක්කොට තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා සුදුස්සන් තෝරාගනු ලැබේ. එහිදී මධ්‍යම පළාතේ පූර්වාසන්න වසර 03 ක ස්ථිර පදිංචි අයදුම්කරුවන්ට ප්‍රමුඛත්වය ලබා දෙනු ලැබේ. විභාගයේ ප්‍රතිඵල මත පත්කරනු ලබන අයගේ සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක කරන දිනය මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම පිරවීමට හෝ නොපිරවීමට හා අවශ්‍යතාවය මත ඒ ඒ මාධ්‍යයන්ගෙන් පිරවිය යුතු පුරප්පාඩු සංඛ්‍යාව මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

2.0 පහත සඳහන් භාෂා පරිවර්තන කාණ්ඩ සඳහා බඳවා ගැනීම් කරනු ලැබේ.

(i) සිංහල - දෙමළ
(ii) සිංහල - ඉංග්‍රීසි
(iii) දෙමළ - ඉංග්‍රීසි

3.0 *වැටුප් ක්‍රමය හා වැටුප් පරිමාණය*.-

2007.08.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 (iv) අනුව භාෂා පරිවර්තක I වැනි පන්තියේ වැටුප් කේත අංකය MN 6-2006 A වන අතර භාෂා පරිවර්තක සේවයේ I වන පන්තියේ මාසික වැටුප් පරිමාණය - රු. 21,245- 11 x 365 - 15 x 450 - රු. 31,645 වේ.

4.0 *සේවා කොන්දේසි*.-

(i) මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද , මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2004.10.15 වන දින අනුමත කර ඇති මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ භාෂා පරිවර්තක සේවයේ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතු කෙරෙන හෝ සංශෝධනවලට ද, ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයෙකු භාෂා පරිවර්තක සේවයේ I වන පන්තියට පත් කරනු ලැබේ.

(ii) මෙම විභාගයේ ප්‍රතිඵල මත I වන පන්තියට පත් කරනු ලබන නිලධාරියෙකුගේ සේවය අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත්ව පත්වීම දෙනු ලැබේ. ඔවුන්ගේ තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීම ඇතුළු මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ භාෂා පරිවර්තක සේවයේ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් අවශ්‍යතාවයන් සම්පූර්ණ කල පසු සේවයෙහි ස්ථිර කිරීම සිදු කරනු ලැබේ.

5.0 තෝරාගත් අපේක්ෂකයන් වැඩ බාර ගැනීමට නියමිත දිනට පෙර රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් කෙරෙන වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය යුතුය. දිවයිනේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට අපේක්ෂකයා ශාරීරික වශයෙන් සුදුසුයැයි සහතික කරනු නොලැබුවහොත් එම පත්වීම ක්‍රියාත්මක නොවනු ඇත.

6.0 සුදුසුකම් :

(i) ශ්‍රී ලංකා පුරවැසියෙකු වීම,

(ii) අ.පො.ස. (සා.පෙළ) හෝ ඊට සමාන විභාගයකදී දෙවැනි භාෂාවට සම්මාන සාමාර්ථයක් හෝ දෙවැනි භාෂාව පිළිබඳ පිළිගත හැකි ඊට උසස් සුදුසුකමක් සමඟ 1 වැනි භාෂාවට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම ;

*සහ*

(iii) *(අ)* පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් ලබා තිබීම ;

*හෝ*

*(ආ)* නීතිඥ විභාගය සමත්වී සිටින ;

*හෝ*

*(ඇ)* පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ බහු තාක්ෂණික ආයතනයක වාණිජ විද්‍යා ඩිප්ලෝමා සහතික ලබා සිටින ;

*හෝ*

*(ඈ)* ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ කළමනාකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා උසස් සහතිකය ලබා සිටින ;

*හෝ*

*(ඉ)* මොරටුව විශ්වවිද්‍යාලයේ ජාතික තාක්ෂණික ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.

*සටහන*.- ඉහත උපාධි හෝ සහතික අයදුම්පත් භාර ගන්නා අවසාන දින හෝ ඊට පෙර දිනක සිට වලංගු වන්නක් විය යුතු ය.

(iv) *වයස් සීමාව*.- 2015.04.30 දිනට අවුරුදු 18 ට එළඹ ඇති හා අවුරුදු 45 කට එළඹ නොමැති පුද්ගලයෙකුට (රජයේ සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර නිලධාරීන් සම්බන්ධයෙන් ඉහත වයස් සීමාව බලනොපානු ඇත) විවෘත තරග විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් ඇත.

*සටහන*.- සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි යන භාෂා විෂයයන්ගෙන් 02 ක් තම උපාධියේදී සමත්වී ඇති විට, එවැනි සුදුසුකම්ලත් අයෙකු තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය යෝජිත වැටුප් පරිමාණයේ ආරම්භක වැටුපට වැටුප් පියවර දෙකක් ඉහළින් තබනු ඇත.

7.0 *විභාග ගාස්තු*.- විභාග ගාස්තුව රු. 600 කි. මෙම මුදල මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක 20-03-02-13 දරන ආදායම් ශීර්ෂයට බැර වන සේ මධ්‍යම පළාතේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා අයදුම්කරුගේ නමින් ම ලබා ගන්නා ලද ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැළවෙන සේ ඇලවිය යුතුය. කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. ලදුපතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකි ය.

8.0 ඉල්ලුම් කිරීමේ ක්‍රමය :

*(අ)* අයදුම්පත්‍රය මෙම නිවේදනය සමඟ ඇති ආදර්ශ ආකෘතියට අනුකූලවිය යුතු අතර එය කඩදාසියේ දෙපැත්ත ප්‍රයෝජනයට ගනිමින් ඒ 4 (සෙ. මී. 21. x 29) ප්‍රමාණයේ කඩදාසිවල සකස් කර අපේක්ෂකයා විසින්ම පිරවිය යුතුය. අංක 01 සිට 04 දක්වා අයදුම්පත්‍රයේ පළමු පිටුවට ද අංක 05 සිට 09 දක්වා එහි අනෙක්

පිටුවේ ද අංක 10 සිට 13 දක්වා තුන්වෙනි පිටුවේ ද වන පරිද්දෙන් තම අයදුම්පත්‍ර සකස් කළ යුතු බව විශේෂයෙන් සැලකිය යුතුය. අයදුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතු ය.

(ආ) අයදුම්පත්‍රය අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අදහස් කරන භාෂාවෙන් සකස් කළ යුතු ය.

(ඇ) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකරුවෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 240,360 කට වැඩි වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් හෝ සහතික කරනු ලැබ තිබිය යුතු ය.

(ඈ) විභාගය සඳහා වන සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය ලියාපදිංචි කළ තැපෑලෙන් 2015.05.26 දින හෝ ඊට පෙර හෝ ලැබෙන සේ, "ලේකම්, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 244, කටුගස්තොට පාර, මහනුවර" යන ලිපිනයට එවිය යුතුය. එදිනට පසුව ලැබෙන කිසිම අයදුම්පත්‍රයක් භාරගනු නොලැබේ. අයදුම්පත්‍රය බහා එවන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ "මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ භාෂා පරිවර්තක තනතුරේ I පන්තියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය" යන්න පැහැදිලි ලෙස ලිවිය යුතු ය.

(ඉ) දැනට රජයේ දෙපාර්තමේන්තුවල සේවයේ නියුක්ත අපේක්ෂකයින් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් මඟින් අයදුම්පත්‍ර ඉදිරිපත් කළ යුතුය. යම්කිසි අපේක්ෂකයෙක් එසේ කිරීමට අපොහොසත් වේනම් ඔහු නුසුදුස්සෙකු ලෙස සලකනු ලැබේ.

(ඊ) සෑම ආකාරයෙන්ම සම්පූර්ණ වී නැති අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කිරීමට ඉඩ ඇත. තැපැල් කිරීමේ දී අයදුම්පත්‍රය නැතිවීම හෝ ප්‍රමාද වීම හෝ ගැන කෙරෙන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

9.0 *විභාගයට ඇතුළත් වීම* :

(අ) නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් අයදුම්කර ඇතැයි යන නිගමනය මත, විභාග ගාස්තු ගෙවා නියමිත දිනයට හෝ ඊට පෙර අයදුම්පත් ඉදිරිපත් කර ඇති සියලුම අයදුම්කරුවන්ට විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු ලැබේ. විභාගයට පෙනී සිටීමට ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට අදාළ නිවේදනය අනුව සුදුසුකම් පරීක්ෂා කරන අවස්ථාවකදී අවශ්‍ය සුදුසුකම් නොමැති බවට අනාවරණය වුවහොත් එම අයගේ පත්වීම ලැබීමට ඇති හිමිකම අවලංගු කරනු ලැබේ. සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදාළ සුදුසුකම් මෙම නිවේදනයේ සඳහන් නියමිත දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කිරීම අනිවාර්ය වේ.

10.0 *අයදුම්කරුගේ අනන්‍යතාවය*.- අයදුම්කරුවන් විභාග ශාලාව තුළදී පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් අපේක්ෂකයෙකු විභාග ශාලාවේදී තම අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

(1) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත ;

(2) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

11.0 *සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම්*.- අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් ඔහු/ඇය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත් එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමින් යටපත් කර ඇත්නම් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

12.0 *විභාග ක්‍රමය*.- ලිඛිත විභාගය හා සම්මුඛ පරීක්ෂණය යන කොටස් දෙකකින් යුක්ත ය.

12.1 *ලිඛිත විභාගය* : පහත සඳහන් විෂයයන් පිළිබඳ ප්‍රශ්න පත්‍රවලින් සමන්විතය.

| | | |
|---|---|---|
| 1. පරිවර්තනය | ලකුණු 100 | පැය 03ක ප්‍රශ්න පත්‍රයක් |
| 2. ඉංග්‍රීසි භාෂාව | ලකුණු 100 | පැය 01 1/2ක ප්‍රශ්න පත්‍රයක් |
| 3. සිංහල භාෂාව | ලකුණු 100 | පැය 01 1/2ක ප්‍රශ්න පත්‍රයක් |
| 4. දෙමළ භාෂාව | ලකුණු 100 | පැය 01 1/2ක ප්‍රශ්න පත්‍රයක් |
| 5. අවබෝධය | ලකුණු 100 | පැය 01 1/2ක ප්‍රශ්න පත්‍රයක් |

12.1.1 *විෂය නිර්දේශය*.-

(1) පරිවර්තනය.-

කාර්යාලීය ලියවිල්ලකින් හෝ වාර්තාවක හෝ පුවත්පත් ලිපියකින් හෝ උපුටා ගන්නා ලද උධෘතයන් ඇතුළු කාර්යාලීය විද්‍යාත්මක නෛතික හා තාක්ෂණික ලියවිලිවලින්ද සම්භාව්‍ය/සාහිත්‍ය ග්‍රන්ථවලින්ද උපුටාගත් දුෂ්කර පාඨ කීපයක් පහත දැක්වෙන ආකාරවලින් එකක් අනුව පරිවර්තනය කිරීම.

(i) සිංහලෙන් දෙමළ බසට සහ දෙමළ බසින් සිංහලට
(ii) සිංහලෙන් ඉංග්‍රීසියට හා ඉංග්‍රීසියෙන් සිංහලට
(iii) දෙමළ බසින් ඉංග්‍රීසියට හා ඉංග්‍රීසියෙන් දෙමළ බසට

(පරිවර්තනයේදී උසස් කුසලතාවයක් අපේක්ෂා කෙරේ.)

*සටහන* : ඉංග්‍රීසි/සිංහල/දෙමළ භාෂා ප්‍රශ්නපත්‍ර - මේ සඳහා භාෂා තුනෙන්ම ප්‍රශ්න පත්‍ර පිළියෙල කරන අතර ඉන් අදාළ භාෂා දෙකක ප්‍රශ්න පත්‍රවලට අපේක්ෂකයින් පෙනී සිටිය යුතු ය.

(2) ඉංග්‍රීසි භාෂාව

රචනයෙන් දෙනලද වචන යොදා ඒවායේ අර්ථ පැහැදිලි වනසේ වාක්‍ය තැනීම, වාග් සම්ප්‍රදායන් තේරුම් කිරීම, සංයුක්ත හා සංකීර්ණ වාක්‍ය ඛණ්ඩවලට විග්‍රහ කිරීම.

(3) සිංහල භාෂාව

රචනයක් ලිවීම, සාරාංශයක් ලිවීම, දෙන ලද ඡේදයක් සංෂිප්ත කොට තම වචනයෙන් ප්‍රකාශ කිරීම, වචනවල අර්ථ නිරූපනය වන ලෙස වාක්‍ය

තැනීම ; වාක්‍යයන්හි ව්‍යාකරණ නිවැරදි කිරීම, වාග් සම්ප්‍රදායන් තේරුම් කිරීම.

(4) දෙමළ භාෂාව

රචනයක් ලිවීම, සාරාංශයක් ලිවීම, දෙන ලද ඡේදයක් සංෂිප්ත කොට තම වචනයෙන් ප්‍රකාශ කිරීම. වචනවල අර්ථ නිරූපනය වන ලෙස වාක්‍ය තැනීම. වාක්‍යයන්හි ව්‍යාකරණ නිවැරදි කිරීම, වාග් සම්ප්‍රදායන් තේරුම් කිරීම.

(5) අවබෝධය

සිංහල/දෙමළ/ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම පිළියෙල කරන ලද අවබෝධය ප්‍රශ්න පත්‍රය සඳහා තමන් කැමති එක් භාෂාවකින් පිළිතුරු සැපයීමට අපේක්ෂකයෙකුට ඉඩදෙනු ලැබේ.

මේ සඳහා පාඨ ගණනාවක් අපේක්ෂකයින්ට දෙනු ලැබේ. ඇතැම් පාඨයන් සම්බන්ධයෙන් අපේක්ෂකයා වෙත විකල්ප ප්‍රකාශයන් ගණනාවක් ඉදිරිපත් කෙරෙන අතර ඉන් එකක් එම පාඨයේ ඇති කරුණුවලට වඩාත්ම හොඳින් ගැලපේ. අපේක්ෂකයා වඩාත්ම උචිත ප්‍රකාශය තෝරා ගත යුතු වේ. අනෙක් පාඨයන් සම්බන්ධයෙන් ප්‍රශ්න පිළියෙල කරනු ලබන්නේ අපේක්ෂකයා එම පාඨවල අර්ථය වටහා ගන්නා ප්‍රමාණය පරීක්ෂා කිරීමට හැකිවන පරිදිය.

*සැ. යු.* - අපැහැදිලි අත් අකුරු සහ අක්ෂර වින්‍යාස දෝෂ සඳහා ලකුණු අඩු කරනු ලැබේ. අත් අකුරු කියවිය නොහැකි අපේක්ෂකයෙකුගේ සුදුසුකම් අවලංගු කළ හැක.

12.1.2 සෑම ප්‍රශ්න පත්‍රයකින්ම අවම වශයෙන් ලකුණු 40 ක් ලබා ගන්නා අපේක්ෂකයන් අතරින් එම ලකුණුවල කුසලතා අනුපිළිවෙල මත පවත්නා පුරප්පාඩු අනුව පත්වීම් ලබාදෙනු ඇත.

12.2 *සම්මුඛ පරීක්ෂණය*.- සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන්නේ සුදුසුකම්, සහතික හා මනා සෞඛ්‍ය තත්වය පරීක්ෂා කර බැලීම සඳහා පමණි. මේ සඳහා ලකුණු ලබාදෙනු නොලැබේ.

13.0 සියලුම අයදුම්කරුවන් අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමට පෙර බඳවා ගැනීමේ නිවේදනය හොඳින් කියවා බලා තේරුම් ගත යුතු ය. අදාළ සංකේත නිවැරදිව සඳහන් කළ යුතු අතර ප්‍රමාද දෝෂ හා වැරදීම් නිවැරදි කිරීම සඳහා කරනු ලබන කිසිම අභියාචනයක් සලකා බලනු නොලැබේ. අයදුම්පතේ සහ මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

14.0 මෙම විභාග නිවේදනයට අනුව විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුව ද මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

ආර්. එම්. එන්. රත්නායක,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත.

2015 අප්‍රේල් මස 01 වැනි දින,
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
අංක 244,
කටුගස්තොට පාර,
මහනුවර.
වෙබ් අඩවිය : www.psc.cp.gov.lk

ආදර්ශ අයදුම්පත්‍රය

*මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ භාෂා පරිවර්තක තනතුරේ I පන්තියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය*

Open Competitive Examination for Recruitment to Class 1 of Central Provincial Translators' service

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණයි)

01. ඔබ තරග කරන්නේ භාෂා පරිවර්තක සේවයේ කුමන තනතුරක් සඳහා යන්න මෙහි පහතින් සඳහන් කරන්න.

i. සිංහල - දෙමළ භාෂා පරිවර්තක - 1
ii. සිංහල - ඉංග්‍රීසි භාෂා පරිවර්තක - 2
iii. දෙමළ - ඉංග්‍රීසි භාෂා පරිවර්තක - 3

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

02. ඔබ විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

සිංහල - දෙමළ - 1
සිංහල - ඉංග්‍රීසි - 2
දෙමළ - ඉංග්‍රීසි - 3

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

03. (i) අයදුම්කරුගේ මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා : PERERA A. B.

(ii) සම්පූර්ණ නම :————. (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

(iii) සම්පූර්ණ නම :————. (සිංහලෙන්/දෙමළෙන්)

04. (i) විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

(ii) විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :————.
(සිංහලෙන් /දෙමළෙන්)

(iii) ස්ථිර ලිපිනය :————. (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

(vi) රාජකාරි ලිපිනය :————. (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

(v) ජාතික හැඳුනුම්පත් අංකය :

(vi) දුරකථන අංකය :

05. (i) ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී - 1
පුරුෂ - 0

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

(ii) ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද යන වග :————.

(iii) ජන වර්ගය :
සිංහල - 1
ලංකා දෙමළ - 2
ඉන්දියානු දෙමළ - 3
මුස්ලිම් - 4
වෙනත් - 5

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

06. විවාහක/අවිවාහක භාවය.-

විවාහක - 1
අවිවාහක - 2

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

07. (i) උපන් දිනය ෘ

වර්ෂය ෘ ☐☐☐☐ මාසය ෘ ☐☐ දිනය ෘ ☐☐

(ii) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස ෘ

අවුරුදු ෘ ☐☐ මාස ෘ ☐☐ දින ෘ ☐☐

08. බඳවා ගැනීමේ නිවේදනයේ 6.0 ඡේදය ප්‍රකාර මෙම විභාගයට පෙනී සිටීම සඳහා ඔබ ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ විස්තර ෘ

*(අ)* (i) උපාධියේ හෝ සුදුසුකම් ලත් සහතිකයේ නම :—————.
(ii) එකී සහතිකය ලබාගත් ආයතනයේ නම :—————.
(iii) උපාධිය හෝ සහතිකය වලංගු වන දිනය :—————.
(vi) උපාධිය සමත් භාෂා මාධ්‍යය :—————.
(v) උපාධියේදී සමත් වෙන භාෂාවන් :—————.

1. :—————.
2. :—————.

*(ආ)* (i) පළමු භාෂාවට සම්මාන සාමාර්ථය ලද අ.පො.ස. (සා/පෙළ) විභාගය හෝ ඊට සමාන සුදුසුකම්ද ලද විභාගය :————.
වර්ෂය :—————.

(ii) වෙනත් භාෂාවට සම්මාන සාමාර්ථය ලද අ.පො.ස. (සා/පෙළ) විභාගය හෝ ඊට සමාන සුදුසුකම් ද ලද විභාගය :————.
වර්ෂය :—————.

09. ඔබ දැනට රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන්නේ ද යන වග ෘ ඔව්/නැත

තනතුරේ නම :—————.
පත්වූ දිනය :—————.
දැනට සේවයේ යෙදෙන ආයතනය :—————.

10. ලදුපත නොගැළවෙන සේ මෙහි අලවන්න.

| |
|---|
| ලදුපත නොගැළවෙන සේ මෙහි අලවන්න |

11. මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය පරිදි සත්‍ය බවත් විභාග ගාස්තු ගෙවන ලද අංක............. හා..................... වැනි දින දරන මුදල් කුවිතාන්සිය මීට අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. තව ද විභාග නීති රීතිවලට අනුව ක්‍රියා කිරීමටත් මෙම විභාගයට පෙර හෝ එය පවතිද්දී හෝ මාගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන තීරණයකට මම එකඟ වෙමි.

තව ද, මෙම අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමට පෙර බඳවා ගැනීමේ නිවේදනය හොඳින් කියවා තේරුම් ගන්නා ලද බවත් සංකේත අංකවල හා සපයන ලද තොරතුරුවල වැරදීමක් හෝ මා අතින් වෙනසක් ඇති වුවහොත් ඉන් සිදුවන පාඩුව මා විසින්ම දරා ගන්නා බවත් ඊට අදාළව අභියාචනා ඉදිරිපත් නොකරන බවත් පොරොන්දු වෙමි. (තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන නීතිරීතිවලට හා විභාග ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.)

—————,
අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන.

දිනය :—————.

12. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම.-*

........................................... පදිංචි........................................ නමැති අය මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන බවත්, .................................. මස ........................... දින ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් මෙයින් සහතික කරමි.

සහතික කරන අයගේ අත්සන :—————.
නම හා තරාතිරම :—————.
ලිපිනය :—————.
නිල මුද්‍රාව :—————.

*සටහන ෘ* දැනට රාජ්‍ය සේවයේ යෙදී සිටින්නන්ගේ අත්සන සහතික කළ යුත්තේ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලයලත් නිලධාරියෙකු විසිනි.

13. *දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය ෘ*

මෙම අයදුම්කරු/අයදුම්කාරිය මෙහි 07, 08, සහ 09 වැනි ඡේදවල දී ඇති තොරතුරු නිවැරදි බවත් ඔහුගේ/ඇයගේ හැසිරීම හා වැඩ සතුටුදායක වූ බවත් අදාළ බඳවා ගැනීමේ නිවේදනය ප්‍රකාරව ඔහු/ඇය මේ විභාගයට පෙනී සිටීමේ සුදුසුකම් සපුරා ඇති බවත් මෙයින් සහතික කරමි. තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් මුදා හැරිය හැකිය.

—————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
සහ නිල මුද්‍රාව.

දිනය :—————.
සහතික කරන ලද නිලධාරියාගේ සම්පූර්ණ නම :—————.
පදවි නාමය :—————.
ලිපිනය :—————.

04-856

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**මහාධිකරණය - යාපනය**

අධිකරණවල රාජසන්තක කරන ලද නඩු භාණ්ඩ ටෙන්ඩර් මගින් විකිණීම

පහත සඳහන් අධිකරණයන්හි රාජසන්තක කරන ලද හා හිමිකම් නොපාන ලද පහත සඳහන් වාහන සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබේ. මීට අදාළ ටෙන්ඩර් ලියවිලි යාපනය මහාධිකරණය මගින් 2015.05.18 දින ප. ව. 2.30 දක්වා නිකුත් කරනු ලැබේ. මේ සඳහා ආපසු නොගෙවන රු. 100 ක පෝරම ගාස්තුවක් යාපනය මහාධිකරණ ගිණුම් ශාඛාවට ගෙවා ලබා ගත හැක.

එකී වාහන අදාළ අධිකරණයන්හි රෙජිස්ට්‍රාර්වරුන් මගින් පරීක්ෂා කිරීමට හැකියාව ඇත. වාහන පිළිබඳ විස්තර සහ ආපසු ගෙවන ඇප තැන්පත් මුදල හා අනෙකුත් කොන්දේසි පහත පරිදි වේ.

| *වාහන විස්තර* | *ආපසු ගෙවිය යුතු ඇප තැන්පත් මුදල* | *අධිකරණය* |
|---|---|---|
| 1. Mahendra Maximo (Red Colour - Small) | 5000.00 | District/Magistrate's Court, Kayts |
| 2. Mahendra Maximo (White Colour - Small) | 5000.00 | District/Magistrate's Court, Mallakam |
| 3. Bajaj Auto Re 2 Stroke | 2000.00 | District/Magistrate's Court, Mallakam |
| 4. Bajaj Auto (AR 4S Green) | 2000.00 | Magistrate's Court, Chavakachcheri |

ලියුම් කවරයක බහාලන ලද මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් ගරු "මහාධිකරණ විනිසුරු, මහාධිකරණය, යාපනය" යන ලිපිනය වෙත 2015.05.18 දින ප. ව. 3.30 ට පෙර ලැබිය හැකි පරිදි ලියාපදිංචි තැපෑලෙන් හෝ සෘජුවම හෝ ගෙනැවිත් මහාධිකරණ ගිණුම් ශාඛාවේ පිහිටි ටෙන්ඩර් පෙට්ටියට (Tender Box) දැමිය යුතු යි. ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරෙහි "කුමන අධිකරණයේ කුමන වාහනය මිලදී ගැනීම සඳහා වූ ටෙන්ඩර් පත ද 2015" යනුවෙන් සඳහන් කළ යුතු යි.

කේ. සිවපාදසුන්දරම්,
සභාපති/මහාධිකරණ විනිසුරු,
මහාධිකරණ ප්‍රසම්පාදන කමිටුව,
මහාධිකරණය,
යාපනය.

04-787

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.